දිවි තොර කරගැනීම් වසංගතයක් ලෙසින් පැතිර යා හැකි බව මුසාවක් නොවේ. එය පර්යේෂණ ඔස්සේද පෙන්වා දී තිබේ. මෙය අනුකරණාත්මක දිවි තොර කරගැනීම් ලෙසින්ද හැඳින්වෙයි. එවැනි තත්වයන් ඇතිවීම වැළැක්වීම සඳහා, මාධ්‍ය මගින් දිවි තොර කරගැනීම් වාර්තාකරණයේදී ප්‍රවේසම්කාරී වීම සහ ඒ සම්බන්ධ මාධ්‍ය ආචාර ධර්ම තරයේ පිළිපැදීම අවශ්‍ය වෙයි.

උදාහරණයක් ලෙසින් දක්වන්නේ නම්, දිවි තොර කරගත් ආකාරය දැක්වීම මගින් තවත් අයෙකුට එම ක්‍රමය අනුකරණය කිරීමට උත්ප්‍රේරණයක් සැපයීමට හැක.

එසේම දිවි තොර කරගැනීම් පිළිබඳ පුවත් වාර්තා සමගින් හදිසි උපකාරක අංක පළ කිරීම ඔස්සේ, දිවි තොර කරගැනීමේ නැඹුරුවක් ඇති අයෙකුගේ ජීවිතයක් බේරාගැනීමට ඉඩක් සැලසිය හැක.

මෙම දිවි තොර කරගැනීමේ සිදුවීම්, එම දිනයේ මෙම සිංහල පුවත්පත් වල සහෝදර ඉංග්‍රීසි භාෂා පුවත්පත් තුළ ආවරණය වී නොතිබුණු බවද මෙසේම සඳහන් කරමු.

හදිසි උපකාරක අංක:
*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)

මූලාශ්‍ර:

https://www.suicideinfo.ca/resource/suicidecontagion/
https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...

**#MediaEthicsSL #lka #sinhalanews #Mawbima #Divaina**